කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (පැරණි නිර්දේශය)

සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය SINH – E 2025

සෑම කොටසකින්ම අයත්වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

## 1 කොටස

01. සංස්කෘතිය යනු කුමක්දැ'යි පැහැදිලි කොට භෞතික සහ අභෞතික සංස්කෘතිය අතර ඇති සබඳතාව කවරේ දැ' යි නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

02. උපසංස්කෘතීන් බිහිවීමෙහිලා හේතුකාරක වන සමාජ - ආර්ථික සාධක පැහැදිලි කරන්න.

03. කුල ක්‍රමය හා සමාජ සංවිධානය අතර පැවතියේ කෙබඳු සබඳතාවක්දැ'යි නිදසුන් සහිතව පහදන්න.

නැතහොත්

පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. සංස්කෘතික අනන්‍යතාව
ii. ජනප්‍රිය සංස්කෘතිය
iii. සංස්කෘතික සංවිධානය
iv. සංස්කෘතිය හා භාෂාව

## 11 කොටස

04. "ජනශ්‍රැතියෙහි උත්පත්ති ස්ථානය වන්නේ ජනජීවිතයයි." විභාග කරන්න.

05. "භාරතීය චරිතයක් තේමා කර ගැනුණු කෘතියක් වුව ද යසෝදරාවතට මහනුවර කාලීන සමාජ පසුබිම ප්‍රවේශ වී ඇත." මේ කියමනෙහි සත්‍යාසත්‍යතාව පහදන්න.

06. දේශීය ජනජීවිතය අධ්‍යයනය කිරීමෙහි ලා, සිංහල ජනකතාවෙන් කෙබඳු පිටුබලයක් ලද හැකි දැ' යි නිදසුන් සහිතව පිරික්සන්න.

නැතහොත්

ජනශ්‍රැතියෙහි ප්‍රමුඛාංගයක් වන ජනකවිය මඟින් සාම්ප්‍රදායික ජනජීවිතය පිළිබඳ අධ්‍යයනයට සැපයෙන පිටුබලය කෙබඳු දැ'යි සාකච්ඡා කරන්න.

## 111 කොටස

07. සිංහල භාෂාවේ සම්භවය සම්බන්ධ ව පවත්නා විවිධ මත පිළිබඳ විමසීමක් කරන්න.

නැතහොත්

විවිධ භාෂා පවුල් පිළිබඳ හැඳින්වීමක් කොට සිංහලය ඉන් කිනම් භාෂා පවුලකට අයත් වේ දැ'යි නිදසුන් සහිත ව පහදන්න.

08. සිදත්සඟරා අක්ෂර මාලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට එය නූතන සිංහල ලේඛන ව්‍යවහාරයට අදාළ අක්ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පහදන්න.

09. සිදත්සඟරාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ විමසීමක් කරන්න.

10. අනාගත කාලික ක්‍රියා රූපය පිළිබඳ සිදත්සඟරා කතුවරයාගේ ඉගැන්වීම් විමසුමට ලක්කරන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි.)

*************************************